## සහල් ආශ්‍රිත බේකරි නිෂ්පාදන ප්‍රදර්ශණය කිරීමක්
## Product Display on Rice based bakery products

සහල් ආශ්‍රිත බේකරි නිෂ්පාදන ප්‍රදර්ශණය කිරීමක් කාර්මික තාක්ෂණ ආයතන මගින් ඔක්තෝබර් 30 වන දින ප.ව. 1.00 සිට ප.ව. 5.00 දක්වා අංක , 363, බෞද්ධාලෝක මාවත , කොළඹ 07 යන ස්ථානයේ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය් ඉල්ලීම් අනුව දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් සාමාජිකයින්ටද මේ සඳහා සහභාගී වීමට අවස්තාවක් ලැබී ඇත. බේකරි කර්මාන්තයේ යෙදී සිටින ව්‍යවසායකයින්ට හා සහල් ආශ්‍රිත නිපදවිය හැකි නව බේකරි නිෂ්පාදන පිළිබඳව උනන්දුවක් දක්වන ව්‍යවසායකයින්ට මෙම ඉදිරිපත් කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

මෙයට සහභාගීම් සඳහා උනන්දුවක් දක්වන දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ විස්තර ඔක්තෝබර් 25 වන දිනට පෙර ජාතික වාණිජ මන්ඩලය , SME Unit ,දුරකථන 2689597,2689598 වෙත දන්වන්න.

---

ඔබට අවශ්‍ය ඕනෑම සේවාවක් පිළිබද වැඩි විස්තර සඳහා

| | | | |
|---|---|---|---|
| පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය, | - | නිරෝෂ් ඒකනායක | : 689597 |
| අන්තර්ජාල පහසුකම් / ඊ මේල් සම්බන්ධතාවය | - | උපුල් රත්නායක | : 689597 |
| වෙළඳ ලියකියවිලි, | - | තිස්ස රූබේරු | : 689598 |
| අපනයන සංඛ්‍යා දත්ත | - | අජිත් සේනාරත්න | : 689598 |

වෙනත් තොරතුරු

| | |
|---|---|
| ඊ.එම් විජේතිලක (ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය මහ ලේකම්) | : 689805 |
| මාලිකා බේරුගොඩ (නියෝජ්‍ය මහ ලේකම්) | : 689600 |
| මල්කා සුදර්ශනී | : 689805 |

වලින් හෝ පහත දුරකථන අංක වලින් අමතන්න
075-374801-3, 075-374805-7,


සියළු විමසීම් සඳහා අමතන්න

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
අංක 450 , ඩී.ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
දුරකථන: 01-689600 ,689597, 689805, 075374801-3, 075-374805-7
ෆැක්ස් 689596
ඊමේල් nccsl@slt.lk, nccslsg@sltnet.lk
වෙබ් : www.nationalchamberlk.org



දායකත්වය : මල්කා සුදර්ශනී ,අජිත් සේනාරත්න



# FASME News
# පුවත්

වෙළුම 01 කලාපය 4 2003 ඔක්තෝබර්

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයේ ප්‍රකාශනයකි


**ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය වෙතින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ඔබට .....**

*සේවා හා පහසුකම් - Services & Facilities*

## ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය සු. ම. ව්‍යවසායකයින් සඳහා දිස්ත්‍රික් වෙළඳ තොරතුරු මධ්‍යස්ථාන අරඹයි.
## NCCSL inaugurates Trade Information Centers for SMEs

ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාවට සේවා හා සහය සපයන ප්‍රමුඛතම ආයතන බවට පත්වීම "යන තම ඉදිරි දර්ශනය ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් පසුගිය ඔක්තෝබර් 1 දින වෙන්නප්පුව (පුත්තලම) හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි වෙළඳ තොරතුරු මධ්‍යස්ථාන පිහිටු විය. උත්සවයට පුත්තලම , අනුරාධපුර සුම.ව්‍යසංගම් කවුන්සිල සාමාජිකයින්, අනිකුත් සාමාජිකයින් සහභාගී වුහ. නිල් සෙනවිරත්න , මහ ලේකම් , මාලිකා බේරුගොඩ , නියෝජ්‍ය මහ ලේකම් හා උපුල් රත්නායක , කළමණාකරු (පරිගනක දත්ත) යන මහත්ම මහත්මින් ජාතික වාණිජ මණ්ඩලය නියෝජනය කරමින් එම අවස්තාවට සහභාගී වුහ.



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙතින් ඉදිරිපත් වන වෙළඳ විමසීම් සඳහා අදාල තොරතුරු සැපයීමට ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය වෙත සම්බන්ධ වීමට මෙම ම්‍යස්ථානයන් වෙත ඊ මේල් සම්බන්ධතාවය ලබා දී ඇත. මෙම තොරතුරු මධ්‍යස්ථාන සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය ලබා දී ඇති අතර ඒ ඔස්සේ සුළු හා මධ්‍ය පරිමාණ SEE Page 2

නිල් සෙනවිරත්න මහතා , මහ ලේකම් , NCCSL,සු.ම.ව්‍ය.සං.පුත්තලම සාමාජිකයින් අමතමින් . උපුල් රත්නායක මයා ,කළමණාකරු පරිගනක දත්ත,(NCCSL)මැක්ඩොනල්ඩ් පෙරේරා මහතා, සභාපති, සු.ම.ව්‍ය.සංගමය- පුත්තලම , මුල්පෙළ අසුන් ගෙන සිටියි.වමේ සිට දකුනට)

ඔස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ගැණුම්කරුවන් හා වෙනත් තොරතුරු ලබා ගත හැකි වනු ඇත. එසේම සෑම දිස්ත්‍රික් සංගමයකටම තම සාමාජික ව්‍යාපාරික ආයතන වල විස්තර ප්‍රදර්නය කිරීමට වෙනම වෙබ් පිටුවක් ලබා දී ඇත. මෙහි ඇති වැදගත්ම කරුණ වන්නේ මෙමගින් දේශීය හා විදේශීය ගැනුම්කරුවන් හා සෘජුව සම්බන්ධ වීමට හා ඒ ඔසස්සේම ගනුදෙනු කිරීමටත් අවස්තාව සලසා තිබීමයි.



සෑම මධ්‍යස්තානයකටම පරිගනයක් හා ඒ හා සම්බන්ධ උපකරන,කාර්යාලීය උපකරන,දුරකථන සම්බන්ධතා සපයා දී ඇත. එසේම ජාතික වාණිජ මණ්ඩලය විසින් පලපුරුදු මධ්‍යස්තාන පරිපාලක නිළධාරින්ද තොරතුරු මධ්‍යස්ථාන වෙත පත් කර ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා මුල්‍යාධාර ලබා දුන් ශ්‍රී ලංකා ICT ඒජන්සිය මේ වසරේ දෙසැම්බර් වන විට මෙම ව්‍යාපෘතිය යටතේ වෙබ් පිටු 800 ඇති කිරීමට ඉලක්ක කොට සිටියි.

උපුල් රත්නායක මයා , කළමණාකරු පරිගනක දත්ත, (NCCSL) අනුරාධපුර දිස්ත්‍රික් සාමාජිකයින්ට මධ්‍යස්තානයෙන් ලැබෙන සේවා ගැන විස්තර කරමින් .

## *සාමාජික පුවත් - Members News*

### සවුත් ඒෂියන් කැනරිස්
### හොඳම වෙළඳ නාමය සම්මානයෙන් පිදුම් ලබයි.
### South Asian Canneries won the "BEST TRADE NAME AWARD ''

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංගම් සම්මේලනයේ සමාජිකත්වය දරන (සු.ම.ව්‍යවසාය සංගමය - කොළඹ සමාජික ) සවුත් ඒෂියන් කැනරිස් පුද්ගලික සමාගම 1996 දී ඇරඹි ආයතනයකි. ශ්‍රී ලාංකික හා දකුණු ආසියානු රටවලට ආවේනික ආහාර නිපදවන ආයතනයක් වන අතර අච්චාරු, චට්නි, සෝස් , ජෑම්, කෝඩියල්, කුළුබඩු හා ශාබසාර නිෂ්පාදන ආයතනයේ ප්‍රධානතම නිෂ්පාදන අතර වේ. ඔවුන් මේ වන විට අපනයනය මට්ටම දක්වා යමින් තම ව්‍යාපාරය වැඩි දියුණු කර ඉතා සාර්ථක මට්ටමකට ලගා වි ඇත.

රටවල් 115 ක නියෝජනයක් ඇති සාමාජිකයින් 15,000 ක පමණ ප්‍රමානයකක් සිටින ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරයේ " Trade Leaders Club" ආයතනයෙන් පිරිනමන හොඳම වෙළඳ නාමය සඳහා වන " Best Trade Name Award ''සම්මානයෙන් "South Asian Canneries'' ආයතනය පිදුම් ලබා ඇත. ඔවුන් මෙම සම්මානය දිනා ගෙන ඇත්තේ සැකසුම් කරන ලද පළතුරු හා එලවළු යන අංශය සඳහායි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික මට්ටමේ සිට අපනයන තත්වය දක්වා සාර්ථක ගමනක් පැමිණ මෙවනි අන්තර්ජාතික සම්මානයකින් පිදුම් ලැබූ South Asian Canneries ආයතනයට ජාතික වාණිජ මන්ඩලයේ මෙන්ම , ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංගම් සම්මේලනයේ උණුසුම් සුභ පැතුම් .........

### කළුතර දිස්ත්‍රික්කයේ සු.ම.ව්‍ය. සංගමයේ මහ සභා රැස්වීම පැවැත්වෙයි.
### AGM of Association of SMEs – Kalutara District

කළුතර සු.ම.ව්‍යවසාය සංගමයේ මහා සභා රැස්වීම පසුගිය සැප්තැම්බර් 27 වන දින ප.ව. 2.00 ට වාද්දුව රිවර් විව් -හෝටලයේදී පැවැතවිනි. එදින ජාතික වාණිජ මණ්ඩලය නියෝජනය කරමින් සු.ම.ව්‍යවසාය කම්ටුවේ සභාපති නලින් කමරගොඩ මහතා සහභාගි විනි. මීට අමතරව සංගමයේ සමාජිකයින් විශාල ප්‍රමාණයක් මෙම අවස්තාවට සහභාගී වුහ. එදින පත් වු නව නිළධාරි මණ්ඩලය මෙසේයි. G S ප්‍රනාන්දු මයා, සභාපති, වජිර සිල්වා මයා. ලේකම්, L C පෙරේරා මයා, භාන්ඩාගාරික, ජගත් කුමාරසිරි, උප ලේකම්, ආනන්ද රණසිංහ මයා, උප සභාපති, කාරක සභාව වශයෙන් K A චන්ද්‍රදාස, උපාලි හේමචන්ද්‍ර , උපාලි සොයිසා, M වහබ්, A සුරසේන ,ඉන්දික පෙරේරා , A L පෙරේරා ,S විජේරත්න යන මහත්වරු තේරි පත් වුහ.සංගමයේ අනාගත කටයුතු සාර්තකව කිරීමට නව නිළධාරි මන්ඩලයට අපගේ සුභ පැතුම් .........

### කැගල්ල සු. ම .ව්‍ය සංගමයේ නව නිළධාරි මඩුල්ලක්
### New Council Members elected for Association of SMEs – Kegalle

කැගල්ල දිස්ත්‍රික්කයේ සු.ම.ව්‍ය.සංගමයේ මහා සභා රැස්වීම කැගල්ල සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්විනි. එදින ජාතික වාණිජ මණ්ඩලය නියෝජනය කරමින් සු.ම.ව්‍යවසාය කම්ටුවේ සභාපති නලින් කමරගොඩ මහතා , ශ්‍රී ලංකා සු.ම.ව්‍ය.සං.සම්මේලනයේ සභාපති දයානන්ද සල්වතුර මහතා, කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉහල නිළධාරින් ඒ සඳහා සහභාගි වුහ. H රාජපක්ෂ, (සභාපති), D S පියතිලක (උප සභාපති), සරත් කුමාර ( ලේකම්) , D ජයසිංහ මිය (උප ලේකම්),M R D සිල්වා( භාන්ඩාගාරික) ,A ජයගොඩ (විගනන පරික්ෂක) යන මහත්ම මහත්මින් නව නිළධාරි මඩුල්ල ලෙස තේරි පත් විනි. නව නිළධාරි මන්ඩලයට ඉදිරි කටයුතු සාර්ථකව කර ගෙන යාමට අපගේ සුභ පැතුම් .........

## *විවිධ පුවත් - General News*

### පකිස්ථානු වෙළඳ ධූත පිරිසේ සංචාරය
### Visit of Buying mission from Pakistan

පකිස්තානයේ කරච්චි වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ වෙළඳ ධූත පිරිසක් පසුගිය 6 වෙනිදා ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයට පැමිනීන. එම ධූත පිරිස් අරමුන වුයේ ශ්‍රී ලාංකික අපනයනකරුවන් හමුවි ඔවුන් හා වළඳ ගනුදෙනු ඇතිකර ගැනීමියි. ජෆාර් කච්ඩියා මහතා ධූත පිරිසේ නායකත්වය දැරු අතර කරච්චි කොන්සල් ජනරාල් පී ඩී ප්‍රනාන්දු මහතාද එම් අවස්තාවට සහභාගි විනි. එසේම දිස්ත්‍රික් සු.ම. ව. සංගම් සාමාජිකයින් කිහිප දෙනෙක්ම් එම අවස්තාවට සහභාගි වුහ.